# කතිරයේ බලය


මැතිවරණ කොමිෂන් සභාව

ISSN-2706-0047

2025 ඔක්තෝබර් - 2026 ජනවාරි 9 වන වෙළුම 3 වන කලාපය


## අභිනව මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා ලෙස රසික පීරිස් මහතා 2025.11.14 දින වැඩ භාර ගනී.



ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු වන රසික පීරිස් මහතා 2025.11.14 දින අභිනව මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා ලෙස රාජකාරි භාර ගන්නා ලදි 1998 මාර්තු 02 දින ශ්‍රී ලංක පරිපාලන සේවයේ පත්වීම් ලැබීමෙන් අනතුරුව 1998 සැප්තැම්බර් 15 දින මැතිවරණ දෙපාර්තමේන්තුවේ සහකාර මැතිවරණ කොමසාරිස්වරයෙකු ලෙස සේවයට එක් වු රසික පීරිස් මහතා එතැන් සිට සහකාර මැතිවරණ කොමසාරිස්වරයෙකු, නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්වරයෙකු හා අතිරේක මැතිවරණ කොමසාරිස්වරයෙකු ලෙස මැතිවරණ දෙපාර්තමේන්තුවේ හා මැතිවරණ කොමිෂන් සභාවේ අඛණ්ඩව අවුරුදු 27 ක් සේවය කළ ජ්‍යෙෂ්ඨතම මාණ්ඩලික නිලධාරියා වේ.





## මැතිවරණ කොමසාරිස් ජනරාල් සමන් ශ්‍රී රත්නායක මහතා සිය ධුර කාලය නිම කර 2025.11.13 දින රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගන්නා ලදි.



1995 වර්ෂයේ දී ශ්‍රී ලංකා පරිපාලන සේවයට එක් වූ සමන් ශ්‍රී රත්නායක මහතා මධ්‍යම පළාත් සභාවේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරයෙකු, සමුපකාර සහකාර කොමසාරිස්වරයෙකු, සහකාර ප්‍රාදේශීය ලේකම්වරයෙකු, ගොවිජන සේවා සහකාර කොමසාරිස්වරයෙකු, ප්‍රාදේශීය ලේකම්වරයෙකු, මධ්‍යම පළාත් ප්‍රාදේශීය කර්මාන්ත අධ්‍යක්ෂවරයෙකු වශයෙන් සේවය කොට 2003 දෙසැම්බර් 01 දින මැතිවරණ දෙපාර්තමේන්තුවේ සේවයට එක්ව සහකාර මැතිවරණ කොමසාරිස්වරයෙකු, නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්වරයෙකු, අතිරේක මැතිවරණ කොමසාරිස්වරයෙකු ලෙස මැතිවරණ දෙපාර්තමේන්තුවේ හා මැතිවරණ කොමිෂන් සභාවේ සේවය කොට, 2019.03.11 දින සිට 2019.10.15 දින දක්වා මැතිවරණ කොමිෂන් සභාවේ මැතිවරණ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් ද 2019.10.16 දින සිට විශ්‍රාම ගන්නා දිනය තෙක් මැතිවරණ කොමසාරිස් ජනරාල් ධුරය හොබවන ලදි.මෙයට අමතරව 2017 - 2020 කාලය තුළ සිමා නිර්ණය කොමිෂන් සභාවේ හා පළාත් සභා සීමා නිර්ණය කමිටුවේ වැඩ බලන ලේකම්වරයෙකු ලෙස ද සේවය කර ඇත.

## 2026 ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය ඇරඹේ.

### ඔබේ නම ලැයිස්තුවේ තියෙනවාද?

- ග්‍රාම නිලධාරී කාර්යාලයෙන් ;
- දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයෙන් ;
- වෙබ් අඩවියෙන්: ec.lk/vrd ;
- මෙම QR කේතය භාවිතයෙන් ;

### දැන්ම පරීක්ෂා කරන්න

2026.02.01 දිනට වයස 18 සම්පූර්ණ නම්
[උපත 2008.01.31 හෝ පෙර]

පදිංචිය වෙනස් වී ඇත්නම් හෝ මෙතෙක් ලියාපදිංචි වී නැත්නම් 2026/ER ආකෘති පත්‍රය සම්පූර්ණකොට පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී වෙත භාර දෙන්න

## අලුතින් දේශපාලන පක්ෂ ලියාපදිංචි කිරීම ඇරඹේ

අයදුම්පත් භාර ගැනීම: 2026 ජනවාරි 28 සිට පෙබරවාරි 28 දින ප.ව. 3.00 දක්වා

අයදුම්පත් ලබාගැනීම: මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියෙන් [www.election.gov.lk] හෝ රාජගිරියේ ප්‍රධාන කාර්යාලයෙන් සහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලින්.

අයදුම්පත්යොමු කළ යුතු ලිපිනය: සභාපති, මැතිවරණ කොමිෂන් සභාව, සරණ මාවත, රාජගිරිය.

ලිපිකවරයේ ඉහළ වම්පස "දේශපාලන පක්ෂ පිළිගැනීම වෙනුවෙන් අයදුම් පත්‍රය 2026" යනුවෙන් සඳහන් කළ යුතු වේ.

අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතු ප්‍රධාන ලේඛන:

- ✓ පක්ෂ ව්‍යවස්ථාව
- ✓ නිලධාරී මණ්ඩල ලැයිස්තුව
- ✓ පක්ෂයේ කාන්තා නිලධාරීන්ගේ නම්
- ✓ පසුගිය වසර 4ක විගණනය කළ ගිණුම් වාර්තා
- ✓ පක්ෂයේ ප්‍රතිපත්ති ප්‍රකාශය
- ✓ පක්ෂය ක්‍රියාකාරීව පවතින බවට තහවුරු කරන ලේඛන

වැඩි විස්තර සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ නිල නිවේදනය සහ 2026.01.21 දිනැති අංක 2472/21 දරන ගැසට් පත්‍රය පරිශීලනය කරන්න.

# ජනාධිපතිවරයා තේරීමේ විධික්‍රමය හා කෙනත් ඇරෝ ගේ අභව්‍ය ප්‍රමේයය

(අවසාන කොටස)

ආචාර්ය ජයන්ත සේනාධීර
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ගණිත අංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

කෙනත් ඇරෝ ගේ අභව්‍ය ප්‍රමේයයට අදාල සාකච්ඡාවේ අවසන් අදියරට අප දැන් පැමිණ ඇත. අද අපේ සාකච්ඡාවට භාජනය වන්නේ සාධාරණත්වයේ නිර්ණායක හතර අතුරින් අවසන් නිර්ණායකය වන අදාල නොවන විකල්පයන් ගෙන් ස්වායක්තභාවයේ නිර්ණායකයයි. එම නිර්ණායක අතරින් තුන් වන නිර්ණායකය වන ඒකාකාර භාවයේ නිර්ණායකය පිළිබඳව පසුගිය කලාපයේදී සාකච්ඡා කරන ලදී. ඒ සඳහා යොදා ගත්, සංවර්ධන කමිටුවක සභාපති වරයා තේරීමේ ඡන්ද විමසීම මෙවරද අපට යොදා ගත හැකිය. පහතින් දැක්වෙන්නේ එම ඡන්ද විමසීමේ මුල් අදියරේ ඡන්ද විමසීමයි.

| ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව | 7 | 8 | 10 | 4 |
|---|---|---|---|---|
| පළමු මනාපය | A | B | C | A |
| දෙවන මනාපය | B | C | A | C |
| තෙවන මනාපය | C | A | B | B |

මෙම ඡන්ද විමසීමේදී කිසිම අපේක්ෂකයෙකු මුළු ඡන්ද සංඛ්‍යාවෙන් 50% ට වැඩියෙන් එනම් 15 ක් හෝ ඊට වැඩි පළමු මනාප ලබා නොගත් බැවින්, අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව දෙවන මනාප විශ්ලේෂණයට යා යුතු බව සහ ඒ අනුව ජයග්‍රාහකයා විය යුත්තේ C බව පසුගිය කලාපයේ දී තහවුරු කරන ලදී.

අදාළ නොවන විකල්පයන්ගෙන් ස්වායක්තභාවයේ නිර්ණායකය යනු කුමක් දැයි යළි සිහියට නගා ගනිමු. "නිශ්චිත තෝරා ගැනීමේ පටිපාටියක් යටතේ කිසියම් අපේක්ෂකයෙකු ජයග්‍රාහකයා වී සිටින විට එම ජයග්‍රාහකයා නොවන වෙනත් අපේක්ෂකයෙකු ඉවත්කළ විට හෝ නුසුදුසු වූ විට, අදාළ තෝරාගැනීමේ නීතිය යටතේම නව ජයග්‍රාහකයා විය යුත්තේද පෙර ජයග්‍රහකයාමය." යන්න එම නිර්ණායකයේ විස්තරාත්මක අර්ථයයි.

දැන් අපි ඉහත ඡන්ද විමසීමෙන් පසු A කිසියම් නුසුදුසු කමක් නිසා ඉවත් කරන්නේ යැයි සිතමු. ඔහු අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පටිපාටියට අනුව ඉහත ඡන්ද විමසීමෙන් දෙවන තැන ලබා ගන්නා අපේක්ෂකයායි. ඔහු ඉවත් කිරීමත් සමග සිදුවන්නේ කුමක්ද? ස්වභාවික යුක්තිය අනුව A පළමු මනාපය සහ B දෙවන මනාපය ගත් ඡන්ද පත්‍රිකා 7 න්, A ඉවත් කිරීම නිසා B පළමු තැනට සහ C දෙවන තැනට පත් වේ. එලෙසම A පළමු මනාපය සහ C දෙවන මනාපය ගත් ඡන්ද පත්‍රිකා 4 න් , A ඉවත් කිරීම නිසා C පළමු තැනට සහ B දෙවන තැනට පත් වේ. ඒ අනුව ඉහත ඡන්ද ප්‍රතිඵලයෙන් A ඉවත් කිරීම නිසා ඇතිවන නවතම ප්‍රතිඵලය මෙසේ දැක්විය හැකිය.

| ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව | 7 | 8 | 10 | 4 |
|---|---|---|---|---|
| පළමු මනාපය | B | B | C | C |
| දෙවන මනාපය | B | C | B | B |

දැන් පැහැදිලිවම මුළු ඡන්ද 29 න්, පළමු මනාප 15ක්, එනම් මුළු ඡන්ද සංඛ්‍යාවෙන් 50% ට, වැඩි පළමු මනාප සංඛ්‍යාවක් ලබාගත් B ඡන්ද විමසීමේ ජයග්‍රාහකයා විය යුතු ය. නමුත් කලින් මේ පටිපාටිය අනුවම ජයග්‍රාහකයා වී සිටියේ C ය. මේ අනුව සාධාරණත්වයේ නිර්ණායක හතර අතුරින් අවසන් නිර්ණායකය වන අදාළ නොවන විකල්පයන්ගෙන් ස්වායක්තභාවයේ නිර්ණායකය උල්ලංඝනය වේ.

ඉහත සංසිද්ධිය, ඡන්ද විමසීමෙන් පසුව A තරගයෙන් ඉවත් කිරීම, යන්නට විකල්පව මෙසේද ඉදිරිපත් කළ හැකිය. එම ඡන්දයට මොහොතකට පෙර කිසියම් හේතුවක් නිසා A තරගයෙන් ඉවත්වූයේ යැයි සිතමු. තර්කාන්විතව සිතුවොත් එම ඉවත් වීම නිසා පළමු වගුවෙන් දැක්වෙන මනාපයේ අනු පිළිවෙල වෙනස් වීමට සාධාරණ හේතුවක් නැත. දෙවන වගුව එම තර්කය මත පදනම්ව සකස් වී ඇත. ඒ අනුව ද තරගයේ ජයග්‍රාහකයා B විය යුතු ය.

පසු ගිය ලිපි මාලාව මගින් අප විසින් පෙන්වා දුන්නේ, ජනාධිපතිවරයා තෝරා පත්කරගැනීමේ ඡන්දයක ඡන්දය ලකුණු කර අවසන් වූ පසු ජයග්‍රාහකයා තේරීමේ ක්‍රියාවලියේදී, ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වන පටිපාටියට අනුව සාධාරණත්වයේ පළමු නිර්ණායකය හැර ඉතිරි සියල්ලම උල්ලංඝනය වන අවස්ථා පැවතිය හැකි බවය. එහෙත් ඉන් අදහස් වන්නේ දැනට පවතින ක්‍රමවේදය නුසුදුසු බව හෝ දුර්වල බව නොවේ. නිර්ණායක තුනක්ම උල්ලංඝනය වන අවස්ථා පැවතිය හැකි බවට විශේෂිත උදාහරණ අප විසින් ඉදිරිපත් කළද, ඇත්ත ඡන්ද විමසීමක දී එසේ සිදුවීම ඉතාමත් දුර්ලභ විය හැකිය.

විශේෂයෙන් සඳහන් කළ යුත්තේ 1982 පළමු ජනාධිපතිවරණයේ සිට මේ දක්වා ජනාධිපතිවරණ 9 ක් පවත්වා ඇති අතර, එම සියල්ලේදීම සාධාරණත්වයේ නිර්ණායක හතර අතුරින් එකක් හෝ උල්ලංඝනය වී නොමැති බවය. ඇත්තටම බහුතරය, එනම් පළමු කැමැත්ත වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් 50% ඉක්මවා ඇති අවස්ථාවක, කිසිසේත්ම නිර්ණායක 4 න් එකක්වත් උල්ලංඝනය වීමට ඉඩක් නැත. ජනාධිපතිවරණ 9, අතුරින් ජයග්‍රාහී අපේක්ෂකයා 50% නො ඉක්මවූ අවස්ථාවක් උදාවූයේ 2024

ජනාධිපතිවරණයේ දී පමණි. එම අවස්ථාවේදී ද, පටිපාටිය අනුව උල්ලංඝනය වීමට ඉඩ ඇති 2, 3 සහ 4 නිර්ණායකයන් උල්ලංඝනය සිදු නොවිණි. සාමාන්‍යයෙන් දෙවන මනාපය සාපේක්ෂ වශයෙන් අඩු ප්‍රතිශතයක් ලකුණු කරන අවස්ථාවල දී එම නිර්ණායක උල්ලංඝනය වන අවස්ථා දුර්ලභය.

අවසාන වශයෙන් යළි මතක් කරන්නේ නම් කෙනත් ඇරෝ විසින් සාධනය කරන ලද, ආර්ථික විද්‍යාව පිළිබඳ නොබෙල් ත්‍යාගය හිමි වූ එම "ඇරෝගේ අභව්‍ය ප්‍රමේයයෙන්" කියැවෙන්නේ සාධාරණත්වයේ නිර්ණායක හතරම උල්ලංඝනය නොවන විභවයක් පවතින පරිදි, මනාප පිළිබඳ කටයුතු කළහැකි කිසියම් නිශ්චිත ක්‍රමවේදයක් කිසි දිනක සොයා ගැනීමට නුපුළුවන් වන බවයි.

**ආශ්‍රිත ග්‍රන්ථ**


1. *Excursions of Modern Mathematics - Peter Tannenbaum - 2009*
2. *ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව*


## ජාතික ඡන්ද හිමියන්ගේ දිනය
## පෙබරවාරි 01




## ඩිජිටල් සහභාගීත්වය තුළින් ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරමු.



# 2026
# නව වර්ෂයේ රාජකාරී ආරම්භය.







# දකුණු ආසියාවේ කාන්තා දේශපාලන නියෝජනය: කාන්තා කෝටා ක්‍රමයේ පාඩම් සහ ශ්‍රී ලංකාවේ අනාගතය


**ඉඳුනිල් බණ්ඩාර**
සහකාර මැතිවරණ කොමසාරිස් (පාලන)
මැතිවරණ කොමිෂන් සභාව


දකුණු ආසියාව ගෝලීය දේශපාලනයේ විශේෂ ස්ථානයක් හිමිකර ගනු ලබයි. විශාලතම ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයට උරුමකම් කීම, රටවල් අතර පවතින අනන්‍ය සමාජයීය, සංස්කෘතික සහ දේශපාලන විවිධත්වය මෙන්ම භූගෝලීය පිහිටීමද ගෝලීය දේශපාලනය තුළින් දකුණු ආසියානු කලාපයට සැලකිය යුතු වැදගත් කමක් අත් කර දී තිබේ. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියගේ පටන් ගෝලීය දේශපාලනය තුළ ප්‍රථම රාජ්‍ය නායිකාවන් බිහිකළ කලාපය ලෙස දකුණු ආසියාවට කීර්තිමත් ඉතිහාසයක් ඇතත්, මෙම කලාපීය රටවල පාලන ව්‍යුහයන්හි ප්‍රමාණවත් කාන්තා නියෝජනයක් නොමැති වීම ගැටලුවක්ව පවතී. දත්තවලට අනුව දකුණු ආසියානු කලාපයේ පාර්ලිමේන්තු තුළ කාන්තා නියෝජනය සාමාන්‍ය අගයක් ලෙස 14.7% ක පමණ පවතී. එය ගෝලීය පාර්ලිමේන්තුවල කාන්තා නියෝජනයේ සාමාන්‍ය අගය වන 27.1% හා සැසඳීමේදී සැලකිය යුතු අඩු අගයකි (අන්තර් පාර්ලිමේන්තු සංගමය, 2025). පළාත් පාලන ආයතන ව්‍යුහයන්හි මෙම අසමතුලිතභාවය බෙහෙවින් කැපී පෙනුණි.

මෙම අසමතුලිතතාවට පිළියමක් ලෙස පළාත් පාලන මට්ටමින් (Local Authority) කාන්තා නියෝජනය ඉහළ නැංවීමට කලාපයේ බොහෝ රටවල් 'කෝටා' (Quota) හෙවත් අනිවාර්ය නියෝජන ක්‍රමවේද හඳුන්වා දී ඇත.

## කලාපීය කෝටා ක්‍රමවේදයන්ගේ විවිධත්වය

දකුණු ආසියානු රටවල් තම පළාත් පාලන ආයතන තුළ කාන්තා නියෝජනය තහවුරු කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිපාදන හෝ මැතිවරණ නීති රීති භාවිතා කරයි. මෙම ක්‍රමවේදයන් ප්‍රධාන වශයෙන් 'වෙන් කළ ආසන' (Reserved Seats) සහ 'අපේක්ෂක කෝටා' (Candidate Quota) ලෙස හඳුනාගත හැකිය

1. **වෙන්කළ ආසන** (Reserved Seats) ආසනවලින් නිශ්චිත ප්‍රමාණයක් කාන්තාවන් සඳහා පමණක් ඉඩ දීම/ වෙන් කිරීම.
2. **අපේක්ෂක කෝටා** (Candidate Quota) අපේක්ෂක ලැයිස්තුවලින් නිශ්චිත ප්‍රතිශතයක් කාන්තාවන් සඳහා ඉඩ දීම.

මෙලෙස විශේෂ ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම තුළින් පළාත් පාලන ආයතනවල කාන්තා සහික සංඛ්‍යාව වැඩි කිරීම පමණක් නොව, සාම්ප්‍රදායිකව එම ආයතන තුළ පවතින පුරුෂ මූලික දේශපාලන ආධිපත්‍යය බිඳහෙළීමටද, බිම් මට්ටමේදී ජනතාවට සෘජුවම බලපෑමට ලක්වන තීරණ ගැනීම සඳහා කාන්තාවන් දායක කර ගැනීමද ඉලක්ක වී තිබේ.

ඒ අනුව කලාපයේ පවතින රටවල්වලින් ඉන්දියාව, නේපාලය, බංගලාදේශය, පකිස්ථානය, මාලදිවයින සහ ශ්‍රී ලංකාව කාන්තාවන් සඳහා පළාත් පාලන ආයතනවල කෝටා ක්‍රමවේදයන් භාවිතා කරයි. පිටු අංක 06 හි දක්වා ඇති වගුව අංක 01 මගින් එම තොරතුරු පැහැදිලි කර ඇත.

## කෝටා ක්‍රමය මගින් ලද ජයග්‍රහණ

### 1. සංඛ්‍යාත්මක නියෝජනයේ වැඩි වීම

කෝටා ක්‍රමය හඳුන්වා දීම තුළින් දකුණු ආසියානු රටවල් ලබා ඇති මූලිකම ජයග්‍රහණය වන්නේ 'සංඛ්‍යාත්මක නියෝජනය' (**Descriptive Representation**) තහවුරු කිරීමයි. මෙය සාම්ප්‍රදායික පුරුෂ මූලික දේශපාලන ආධිපත්‍යය බිඳ දැමීමටත්, කාන්තාවන්ට දේශපාලන ප්‍රවේශයක් ලබා දීමටත් ඉවහල් වී ඇත.

### 2. සම්පත් බෙදී යාමේ සාධාරණත්වය:

ඉන්දියාවේ සිදුකළ පර්යේෂණවලින් හෙළි වී ඇත්තේ කාන්තාවන් විසින් මෙහෙයවන පංචායත් සභා (ගම් සභා) තුළ පානීය ජලය, මාර්ග සහ සනීපාරක්ෂාව වැනි පොදු යටිතල පහසුකම් සඳහා වැඩි අවධානයක් යොමු කර ඇති බවයි. කාන්තාවන් තීරණ ගන්නා තැන සිටින විට ප්‍රජාවගේ මූලික අවශ්‍යතා වඩාත් කාර්යක්ෂමව ඉටු වන බව මින් ගම්‍ය වේ.

### 3. ආන්තික ජන කොටස්වලට අවස්ථා:

නේපාලයේ කෝටා ක්‍රමය හරහා ඓතිහාසිකව පීඩාවට පත් 'දාලිත්' (Dalit) කුලයේ කාන්තාවන්ට දේශපාලනයට පිවිසීමට අවස්ථාව ලැබුණි. එය සමාජ ධුරාවලිය තුළ පහළම සිටින කාන්තාවට බලය ලබා දීමකි.

### 4. ආදර්ශමත් නායකත්වය:

පළාත් පාලන ආයතන යනු ජාතික දේශපාලනයට අවශ්‍ය නායකත්ව පුහුණු පාසලයි. ගම් මට්ටමින් නායකත්වය දරන කාන්තාවන් දැකීම තුළින් අනාගත පරපුරේ ගැහැණු ළමයින් තුළ දේශපාලනය පිළිබඳ ධනාත්මක ආකල්ප වර්ධනය වේ.

## අභියෝග

#### සංඛ්‍යාත්මක නියෝජනයේ සිට අර්ථවත් නියෝජනයක් කරා

කෙසේ වෙතත්, කාන්තා නියෝජනය සංඛ්‍යාත්මකව වැඩි කිරීම මගින් පමණක් ඔවුන්ගේ 'සක්‍රීය දායකත්වය'(Substantive Representation) තහවුරු වී තිබේද යන්න ගැටලුවකි. දකුණු ආසියාව පුරා පොදු වූ අභියෝග රැසක් මේ හරහා හඳුනාගත හැකිය.

### 1. පුරුෂ මූලික දේශපාලන මැදිහත්වීම (Patriarchal Interference)

දකුණු ආසියාවේ, දේශපාලන ක්ෂේත්‍රය තුළ මුල් බැසගෙන ඇති පුරුෂ මූලික ආධිපත්‍යය කාන්තා නියෝජනයට දැඩි බලපෑමක් එල්ල කරයි. පවතින දේශපාලන සංස්කෘතිය තුළ කාන්තාවන්ගේ ස්වාධීන මතවාද යටපත් කිරීමත්, පක්ෂ දේශපාලනය තුළ පුරුෂ පාර්ශ්වයේ අභිමතය පරිදි කටයුතු කිරීමට සිදුවීමත් නිසා, කෝටා ක්‍රමය මගින් ලැබුණු අවස්ථාව ප්‍රයෝජනයට ගැනීමට කාන්තාවන්ට ඇති ඉඩකඩ ඇහිරී ඇත. පුරුෂ පාර්ශ්වයන්ගෙන් එල්ල වන ප්‍රතිරෝධය හමුවේ කාන්තාවන්ගේ හඬ යටපත් වීමේ ප්‍රවණතාවක් දක්නට ලැබේ.

### 2. වක්‍ර නියෝජනය හෙවත් 'ප්‍රොක්සි' නියෝජනය (Proxy Representation - Sarpanch-Pati)

ඉන්දියාවේ, "සර්පන්ච්-පති" (Sarpanch-pati) න්‍යාය ලෙස මෙය හඳුන්වයි. මෙහිදී කාන්තාව නාමිකව පමණක් තනතුර දරන අතර සැබෑ තීරණ ගනු ලබන්නේ පිරිමි පාර්ශ්වය විසිනි. දකුණු ආසියානු කලාපයේ පත් වූ බොහෝ කාන්තා නියෝජිතවරියන් දේශපාලන පවුල්වල සමීප ඥාතීන් වන අතර, ඔවුන් තම පියාගේ, ස්වාමියාගේ හෝ සහෝදරයාගේ අභිමතය පරිදි කටයුතු කිරීමට පෙළඹී සිටිති. මෙය පාකිස්තානය, බංග්ලාදේශය මෙන්ම ශ්‍රී ලංකාවේද දක්නට ලැබෙන පොදු තත්ත්වයකි.

### 3. තීරණ ගැනීමේ දී පවතින ද්විතියික තත්ත්වය (Secondary status in Decision-making)

පළාත් පාලන ආයතන සඳහා පත් වූ කාන්තාවන්ට බොහෝ විට පැවරෙන්නේ අඩු වැදගත්කමක් සහිත වගකීම්ය. ඔවුන්ගේ යෝජනා සහ අදහස්වලට ප්‍රමාණවත් ඉඩක් ලබා නොදෙන අතර, වැදගත් තීරණ ගැනීමේ ක්‍රියාවලියෙන් (Decision-making process) ඔවුන්ව සීමා කිරීමට හෝ ඉවත් කර තැබීමට කටයුතු කරනු ලබයි.

### 4. දේශපාලන පක්ෂවල සහයෝගය අඩුබව සහ සම්පත් හිඟය (Lack of Support and Resources from Political Parties)

කෝටා ක්‍රමය මගින් කාන්තාවන්ට දොරටු විවෘත වුවද, මැතිවරණ ජයග්‍රහණයෙන් පසු ඔවුන්ට අවශ්‍ය සහයෝගය, අනුග්‍රහය සහ සම්පත් ලබා දීමට දේශපාලන පක්ෂ අපොහොසත් වී ඇත. මෙය කාන්තාවන්ට අර්ථවත් බලපෑමක් ඇති කිරීමට ඇති ඉඩකඩ අහුරා දමන මූලික සාධකයකි.

### 5. ධාරිතා සංවර්ධනයේ සහ පුහුණුවේ ඌනතා (Lack of Capacity Building)

නවක මන්ත්‍රීවරියන් සක්‍රීය නියෝජිතයන් බවට පත් කිරීමට නම් ධාරිතා සංවර්ධනය අත්‍යවශ්‍ය වේ. නීති සම්පාදනය, අයවැය පාලනය සහ සභා රීති පිළිබඳව ප්‍රමාණවත් අවබෝධයක් හෝ පුහුණුවක් නොමැති වීම නිසා ඔවුන්ට සභාව තුළ ස්වාධීනව කටයුතු කිරීමට අපහසු වේ. ඉන්දියාව සහ නේපාලය වැනි රටවල අත්දැකීම් පෙන්වා දෙන්නේ නිසි පුහුණුව සහ සම්පත් ලබා දීම තුළින් කාන්තාවන් සමාජ සේවා සහ සංවර්ධන ව්‍යාපෘතිවල පෙරමුණ ගන්නා බවයි.

## ශ්‍රී ලංකාවේ අත්දැකීම සහ උගත යුතු පාඩම්

ශ්‍රී ලංකාව දකුණු ආසියානු කලාපයේ මෙලෙස කාන්තාවන් සඳහා කෝටා ක්‍රමයක් හඳුන්වා දුන් අවසන් රටවල් කිහිපය අතුරින් එකකි. අංක 16 දරන 2017 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධිත) පනත මගින් 2018 වර්ෂයේ මුල්වරට 25% අනිවාර්ය කෝටා ක්‍රමයක් ඇතුළත් මිශ්‍ර සමානුපාත ක්‍රමවේදයන් අනුව පළාත් පාලන ආයතන සඳහා කාන්තා නියෝජිතයින් තෝරා ගැනීම සිදුකරන ලදී. ඒ හරහා පළාත් පාලන මන්ත්‍රීවරියන් 2000කට ආසන්න පිරිසක් පත්විය. මෙය 2% ක් ව පැවති නියෝජනය 23-25% දක්වා ක්ෂණිකව ඉහළ නැංවීය.

ශ්‍රී ලංකාවේ අත්දැකීම ද කලාපයේ පවතින අනෙකුත් රටවල්වල දක්නට ලැබෙන ලක්ෂණම පෙන්නුම් කරයි. මෙලෙස විශාල කාන්තා සභික සංඛ්‍යාවකට පළාත් පාලන ආයතන තුළට ඇතුළත් වීමේ හැකියාව ලැබුණ ද මෙම ඇතුළත් වූ සභිකයන්ට එම ආයතනවල කටයුතු කිරීමේ දී දැඩි අභියෝග සහ ගැටලුවලට මුහුණ දීමට සිදුවී තිබෙන බව මූලික වාර්තා විශ්ලේෂණයන් සහ පර්යේෂණ වාර්තා සනාථ කරයි.

දකුණු ආසියානු කලාපීය අත්දැකීම් විමසීමේදී ශ්‍රී ලංකාවේ කාන්තා දේශපාලන නියෝජනය අර්ථවත් ඉලක්කයක් කරා ගෙන යාමට පහත කරුණු වැදගත්වන බව හඳුනාගත හැකිය:

- **කෝටාව අවසානය නොව ඇතුලුවීමේ දොරටුවයි.**

ශ්‍රී ලංකාවේ 25% ක කෝටා ක්‍රමය වැදගත් ආරම්භයක් වුවද, එය අවසාන ඉලක්කය නොවිය යුතුය. නේපාලයේ 40% ක් සහ ඉන්දියාවේ ඇතැම් ප්‍රාන්තවල 50% ක් තරම් ඉහළ අගයක් කාන්තාවන් වෙනුවෙන් වෙන් කර ඇත. ශ්‍රී ලංකාව වටහා ගත යුත්තේ සංඛ්‍යාත්මකව මන්ත්‍රීවරියන් පත් කිරීම පමණක් ප්‍රමාණවත් නොවන බවත්, ඔවුන්ට වැඩ කිරීමට අවශ්‍ය වටපිටාව සැකසීම අත්‍යවශ්‍ය බවත්ය.

- **පක්ෂ අභ්‍යන්තර ප්‍රතිසංස්කරණවල අවශ්‍යතාව**

කෝටා ක්‍රමය සාර්ථක වීමට නම් දේශපාලන පක්ෂ තුළ පවතින අපේක්ෂකයන් තේරීමේ ක්‍රියාවලිය විනිවිදභාවයකින් යුක්ත විය යුතු ය. දේශපාලනඥයන්ගේ බිරින්දෑවරුන් හෝ දියණියන් වෙනුවට, සැබෑ නායකත්ව ලක්ෂණ සහිත කාන්තාවන් තෝරා ගැනීමට පක්ෂ යාන්ත්‍රණය සකස් විය යුතුය. එසේ නොමැති වුවහොත් කෝටා ක්‍රමය හුදෙක් පවුල් දේශපාලනය තහවුරු කරන මෙවලමක් පමණක් වනු ඇත.

- **ධාරිතා සංවර්ධනය සහ බලතල ලබා දීම**

පත් වූ මන්ත්‍රීවරියන්ට හුදු අත් උස්සන්නන් ලෙස කටයුතු කිරීමට ඉඩ නොදී, ප්‍රතිපත්ති සම්පාදනයට සහ සම්පත් පරිහරණයට අවස්ථාව ලබා දිය යුතුය. ඉන්දියාව සහ නේපාලය පෙන්වා දෙන පරිදි, නිසි බලතල සහ පුහුණුව ලබා දීම තුළින් කාන්තාවන් ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිවල පෙරමුණ ගනු ඇත.

- **සමාජීය සහ සංස්කෘතික බාධක ජය ගැනීම**

නීතිමය වශයෙන් ආසන වෙන් කළද, පුරුෂ මූලික දේශපාලන සංස්කෘතිය තුළ කාන්තාවන්ට එල්ල වන ප්‍රතිරෝධය සහ බලපෑම් අවම කිරීමට පියවර ගත යුතුය. කාන්තාවන්ගේ හඬ යටපත් කිරීමට දරන උත්සාහයන් පරාජය කරමින් ඔවුන්ට ස්වාධීනව කටයුතු කිරීමට ඉඩ සලසා දීම අනිවාර්ය වේ.

වගුව අංක 01 මගින් කලාපයේ ප්‍රධාන රටවල පළාත් පාලන මට්ටමේ කාන්තා කෝටා ක්‍රමවේදයන් සංසන්දනය කෙරේ:

| රට | නෛතික පදනම සහ කෝටා ප්‍රතිශතය | ක්‍රමවේදයේ ස්වභාවය | විශේෂ ලක්ෂණ |
|---|---|---|---|
| ඉන්දියාව | 33% - 50% (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 73 සහ 74 වන සංශෝධන මගින්) | වෙන් කළ ආසන | ආසන සහ සභාපති ධුරයන්ගෙන් 1/3ක් අනිවාර්යයෙන් කාන්තාවන්ට වෙන් කර ඇත. බිහාර් වැනි සමහර ප්‍රාන්තවල මෙම අගය 50% දක්වා ඉහළ නංවා ඇත. සෘජු මැතිවරණයකින් තෝරාගැනීම සිදුකරයි. |
| නේපාලය | 40.4% (2017 මැතිවරණ පනත සහ 2015 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන මගින්) | වෙන් කළ ආසන | එක් කොට්ඨාසයකින් (Ward) පත්වන සාමාජිකයන් සිව්දෙනාගෙන් දෙදෙනෙකු කාන්තාවන් විය යුතුය. (ඉන් එක් අයෙකු 'දාලිත්' කුලයේ කාන්තාවක් විය යුතුය). නගරාධිපති හෝ උප නගරාධිපති ධුර දෙකෙන් එකක් කාන්තාවක් වීම අනිවාර්ය වේ. |
| බංග්ලාදේශය | 33% (පළාත් පාලන පනත් මගින්) | වෙන් කළ ආසන | සෑම පළාත් පාලන ආයතනයකම (Union Parishad) සාමාන්‍ය ආසනවලට අමතරව කාන්තාවන් සඳහා පමණක් වෙන් වූ ආසන 3ක් පවතී. |
| පාකිස්තානය | 33% (පළාත් පාලන පනත් මගින්) | වෙන් කළ ආසන (වක්‍ර නියෝජනය) | කෝටා ක්‍රමවේදය රට තුළ ඒකාකාරීව සිදු නොවේ. පළාත් අනුව වෙනස් වේ. බොහෝ විට පිරිමි මන්ත්‍රීවරුන් විසින් කාන්තා මන්ත්‍රීවරුන් තෝරා පත් කර ගන්නා වක්‍ර මැතිවරණ ක්‍රමයක් (Indirect Election) භාවිතා වේ. |
| මාලදිවයින | 33% (2019 විමධ්‍යගතකරණ පනත මගින්) | වෙන් කළ ආසන | දූපත් සහ නගර සභා (Island) City Councils) සඳහා 33% ක ආසන ප්‍රමාණයක් කාන්තාවන්ට වෙන් කර ඇත. |
| ශ්‍රී ලංකාව | 25% (අංක 16 දරන 2017 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධිත) පනත මගින්) | අපේක්ෂක සහ සභික සංයුතියෙන් වෙන් කිරීම. | කොට්ඨාස සහ සමානුපාතික ලැයිස්තු (PR List) හරහා අවසාන සභික සංයුතියෙන් 25% ක් කාන්තාවන් බව තහවුරු කළ යුතුය. |

( වගුව අංක 01)

## සමාප්තිය

**සංකේතාත්මක නියෝජනයේ සිට අර්ථවත් නියෝජනයක් කරා**

දකුණු ආසියාව මේ වන විට පළාත් පාලන මට්ටමේ කාන්තා නියෝජනය සම්බන්ධයෙන් ගෝලීය වශයෙන් සුවිශේෂී ස්ථානයක් හිමිකර ගෙන සිටී. එක්සත් ජාතීන්ගේ දත්තවලට අනුව කලාපයේ පළාත් පාලන ආයතනවල කාන්තා නියෝජනය 41.15% ක් වන අතර, එය ගෝලීය සාමාන්‍යය වන 35.6% ඉක්මවා යාමකි. ඉන්දියාව, නේපාලය සහ බංග්ලාදේශය වැනි රටවල් නෛතික ප්‍රතිපාදන හරහා මෙම සංඛ්‍යාත්මක ජයග්‍රහණය ලබාගෙන ඇත.

කෝටා ක්‍රමය යනු කාන්තාවන්ට වැසී තිබූ දොරටු විවර කර දුන් යතුරයි. නමුත් දොර විවර වූ පමණින් ඇතුළත ඇති අසුනක වාඩි වී තීරණ ගැනීමේ අයිතිය ඔවුන්ට ඉබේ හිමි නොවේ. ශ්‍රී ලංකාව ඇතුළු දකුණු ආසියානු රටවල් දැන් කළ යුත්තේ "කාන්තාවන් කී දෙනෙක් සිටීද?" (**Number**) යන්නෙන් ඔබ්බට ගොස් "ඔවුන් කරන්නේ කුමක්ද?"(**Impact**) යන්න ගැන අවධානය යොමු කිරීමයි. නෛතික ප්‍රතිපාදනවලින් ඔබ්බට ගිය සමාජීය සහ දේශපාලනික සංස්කෘතික වෙනසක් තුළින් පමණක් මෙම 'සංකේතාත්මක නියෝජනය', 'අර්ථාන්විත ප්‍රජාතන්ත්‍රවාදයක්' බවට පරිවර්තනය කළ හැකි වනු ඇත.

### ආශ්‍රිත ග්‍රන්ථ -


- ***Bangladesh Local Government Division (2020).*** Union Parishad Women Quota Implementation Report.
- ***Chattopadhyay, R., & Duflo, E.*** (2004). Women as Policy Makers: Evidence from a Randomized Policy Experiment in India. Econometrica, 72(5), 1409-1443.
- ***IJSSER (2025). International Journal of Social Science and Economic Research:*** Women's Participation in Local Governance in South Asia - Challenges and Opportunities.
- ***Institute of Policy Studies.*** (2025). Impact of Sri Lanka's 25% Quota on Women's Political Leadership in Local Government. IPS Research Paper.
- ***Interparlimentary Union (2025).*** Women in National Parliaments: World Classification. UN Women SDG Statistics.
- ***Maldives Ministry of Arts, Culture and Heritage (2020).*** Assessment on Gender Dynamics in Local Governance: 8th Amendment to Decentralisation Act.
- ***Ministry of Panchayat Raj, Government of India (2024).*** 73rd and 74th Constitutional Amendment: Constitutional Safeguards for Women in Local Government.
- N***epal Constitutional Assembly (2015).*** Constitution of Nepal 2015: Articles on Women's Representation in Local Government.







**දැන්වීමයි**

**විදේශගත ශ්‍රී ලාංකිකයින්ට ඡන්ද අයිතිය ලබාදීම සඳහා ක්‍රමවේදයක් සැකසීම පිණිස විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල / තානාපති කාර්යාල, සිවිල් සමාජ සංවිධාන හා විදේශගත ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ අදහස් හා යෝජනා කැඳවීම**

- විදේශ ගත ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ ඡන්ද අයිතිය තහවුරු කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමට අමාත්‍ය මණ්ඩලයේ උපදෙස් මත කමිටුවක් පත්කර ඇත.
- එහිදි වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී වූ විනිවිදභාවයකින් සහ කාර්යක්ෂමතාවයකින් යුත් ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල / තානාපති කාර්යාල, සිවිල් සමාජ සංවිධාන, පොදු මහජනතාව ඇතුළු උනන්දුවක් දක්වන පාර්ශවකරුවන්ගේ ලිඛිත යෝජනා සහ අදහස් ලබා ගැනීමට කමිටුව තිරණය කර ඇත.

ඒ අනුව;

පහත සඳහන් ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ඔබේ අදහස් සහ යෝජනා 2026.02.15 දිනට පෙර පහත ලිපිනයට /විද්‍යුත් ලිපිනයට ඉදිරිපත් කරන ලෙස කමිටුව ඉල්ලා සිටියි.

- ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීම
- ප්‍රචාරණය
- ඡන්දය ප්‍රකාශ කිරීම
- ඡන්ද ගණන් කිරීම හා ප්‍රතිඵල නිකුත් කිරීම

: විදේශගත ශ්‍රී ලාංකිකයින්ට ඡන්දය ප්‍රකාශ කිරීමට හැකිවන ආකාරයෙන් ප්‍රතිපාදන සැලසීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත පත්කරනු ලැබූ කමිටුව,
නීති අංශය,
නො.330,
යූනියන් පෙදෙස,
කොළඹ 02.
ශ්‍රී ලංකාව

: legal@pclg.gov.lk

: 0112302720

මෙම ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා ඔබේ වටිනා අදහස් ගෞරවයෙන් අපේක්ෂ කරමු.

**බී. පී. සී. කුලරත්න**
සභාපති
විදේශගත ශ්‍රී ලාංකිකයින්ට ඡන්දය ප්‍රකාශ කිරීමට හැකිවන ආකාරයෙන් ප්‍රතිපාදන සැලසීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත පත්කරන ලද කමිටුව




# වාර්ෂික පර්යේෂණ සැසිය 2025
# Annual Research SYMPOSIUM -2025

**ඒ.ඒන්.ඒන්. නුෂ්රත්**
සහකාර මැතිවරණ කොමසාරිස් (පළාත් පාලන)
මැතිවරණ කොමිෂන් සභාව

ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව රට තුළ මැතිවරණ ක්‍රියාවලියේ අඛණ්ඩභාව, නිදහස් සහ සාධාරණභාවය සහතික කරන ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය වේ. විනිවිදභාවය, අපක්ෂපාතීභාවය සහ වගකීම පිළිබඳ අසමසම කැපවීම සමග මෙම කොමිෂන් සභාව ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියට නිදහස් සහ සාධාරණ ලෙස සහභාගී විය හැකි වනු පිණිස පුරවැසියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට සුදුසු භූමිය සකසා ඇත.

ඒ අනුව මැතිවරණ කොමිෂන් සභාවේ සහභාගිත්ව උපාය මාර්ග ප්‍රකාරව මහජනතාව අතර මැතිවරණ කාර්යයන් පිළිබඳ උනන්දුව ඇති කිරීමේ අරමුණ ඇතිව මැතිවරණ හා ඡන්ද විමසීම් පරිචයන් පිළිබඳ විද්වතුන් පෙළඹවීම සඳහා වූ මුලපිරීමක් ලෙස පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් අංශය විසින් වාර්ෂික පර්යේෂණ සැසි සංවිධානය කරනු ලැබේ.

මෙම පර්යේෂණ සැසිය මැතිවරණ කළමනාකරණ ක්ෂේත්‍රයේ නීතිමය අධ්‍යයනය ඉදිරියට ගෙන යාමට හේතුවන අතර ගවේෂකයන්, ශාස්ත්‍රවේදීන් සහ සමාජ ක්‍රියාකාරීන් එක් රැස් වී අවබෝධය බෙදාගැනීමට, බුද්ධි කලම්භනයට සහ මැතිවරණ ක්‍රියාවලිය පිළිබඳ නවෝත්පාදන මාර්ග ගවේෂණය සඳහා වූ වේදිකාවක් නිර්මාණය කර ඇත.

ඒ අනුව දෙවන වරට 2024 වර්ෂය සඳහා පර්යෙෂණ සැසිය සංවිධානය කළ නමුත් එම වර්ෂයේ ජනාධිපතිවරණය හා පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීම හේතුවෙන් එහි කටයුතු තාවකාලිකව අත්හිටුවීමට සිදුවිය.

එම අවස්ථාවේ ලද පර්යේෂණ පත්‍රිකා 34 ද ඇතුළුව නැවතත් 2025 වර්ෂය සඳහා පර්යේෂණ සැසිය පැවැත්වීමට කටයුතු සැලසුම් කරන ලදී. අදාළ පර්යේෂණ පත්‍රිකා ලබා ගැනීම සඳහා ත්‍රෛභාෂාවෙන් පුවත්පත් දැන්වීම් පළ කරන ලද අතර මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියෙහි හා නිල ෆේස්බුක් ගිණුමෙහි ප්‍රසිද්ධ කිරීම තුළින් ජාතික හා අන්තර්ජාතික වශයෙන් ද පුළුල් ප්‍රසිද්ධියක් ලබා දීමට තවදුරටත් ක්‍රියා කර තිබේ.

මෙම වර්ෂයේ දී පර්යේෂණ වාර්තා සම්බන්ධයෙන් මහජනතාව සහ විශ්වවිද්‍යාල ප්‍රජාව තුළින් ඉහළ ප්‍රතිචාරයක් ලැබී ඇත. "ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලීන් බලගැන්වීම: ඡන්දදායක සහභාගීත්වය සහ ශ්‍රී ලංකාවේ මැතිවරණ අඛණ්ඩතාව වැඩි දියුණු කිරීම සඳහා උපාය මාර්ග" යන ප්‍රධාන තේමාව පදනම් කර ගනිමින් පහත දැක්වෙන අනු තේමාවන් 10 යටතේ, විවිධ රටවල මැතිවරණ කොමිෂන් සභාවන්හි සමාජිකයන්, රාජ්‍ය ආයතනයන්හි ප්‍රධානීන්, විශ්ව විද්‍යාල ආචාර්යවරුන්, විද්‍යාර්ථයන්, උපාධි අපේක්ෂකයන් මෙන්ම විවිධ ක්ෂේත්‍රයන්හි ප්‍රවීණයන් විසින් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන ත්‍රෛභාෂා නියෝජනය කරමින් පර්යේෂණ පිළිබඳ සාරාංශ පත්‍රිකා 256 ක් ලබා දෙන ලදී.

1. ඡන්දදායක අධ්‍යාපනය, දැනුවත්භාවය සහ සහභාගීත්වය
2. මැතිවරණ තාක්ෂණය සහ නවෝත්පාදනය
3. මැතිවරණ වංචා වැළැක්වීම සහ විනිවිදභාවය සහතික කිරීම
4. අන්තර්කරණය සහ ප්‍රවේශ්‍යතාව
5. මැතිවරණ කෙරෙහි විශ්වාසය සහ විශ්වාසය වර්ධනය කිරීම
6. සිවිල් සමාජයේ සහ මාධ්‍යයේ කාර්යභාරය
7. නීතිමය සහ නියාමන රාමු
8. මැතිවරණවලදී ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීම
9. ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලීන්හි තරුණයින් සම්බන්ධ කර ගැනීම
10. මැතිවරණ සැකසුම් තුළ ආබාධිත අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටීම

පර්යේෂණ ලිපි ඇගයීම් කටයුතු මැතිවරණ කොමිෂන් සභාවේ අනුමැතිය සහිතව විශ්ව විද්‍යාල ආචාරවරුන්ගෙන් සමන්තවිත විද්වත් කමිටුවක් විසින් සිදු කරන ලද අතර, සියලු පර්යේෂණ පත්‍රිකා අතුරින් ප්‍රශස්ථ පර්යේෂණ පත්‍රිකා 157ක් තෝරාගන්නා ලදි.

**පර්යේෂණ ලිපි ඇගයීම් කටයුතු සිදු කරන ලද විද්වත් කමිටුව**

- **ආචාර්ය අජන්ත අතුකෝරාල මහතා, අධ්‍යක්ෂ, පරිගණක අධ්‍යනායතනය, කොළඹ විශ්ව විද්‍යාලය**
- **ආචාර්ය රමේෂ් රාමසාමි මහතා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය**
- **ආචාර්ය අතුල විතානවසම් මහතා, දේශපාලන විද්‍යාව පිළිබඳ මහාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය**

මැතිවරණ හා ඡන්ද විමසීම් පරිචයන් පිළිබඳ විද්වතුන් පෙළඹවීම වස් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන්, විශ්ව විද්‍යාල අංශාධිපතිවරුන්, මහාචාර්යවරුන් සහ ආචාර්යවරුන්, දේශීය හා විදේශීය මැතිරණ නිරීක්ෂණ සංවිධාන සාමාජිකයන්, විද්‍යාර්ථයින් සහ මැතිවරණ කොමිෂන් සභා ප්‍රධාන කාර්යාලයෙහි සහ දිස්ත්‍රික් කාර්යාලයන්හි ප්‍රධානීන්, තේරීපත් වූ පර්යේෂණ පත්‍රිකාවන් ඉදිරිපත් කරන ලද පර්යේෂකයන් ඇතුළුව 300කට ආසන්න පිරිසකගේ සහභාගීත්වයකින් 2025 නොවැම්බර් මස 05 වන දින කොළඹ මොනාච් ඉම්පීරියල් හෝටල් පරිශ්‍රයෙහි පර්යේෂණ සැසිය පවත්වන ලදී.

ඒ අනුව එදින, ප්‍රශස්ත පර්යේෂණ පත්‍රිකා ඇතුළත් ග්‍රන්ථයක් ප්‍රකාශයට පත් කරන ලද අතර, එය පරිශීලකයන්ගේ පහසුව පිණිස මැතිවරණ කොමිෂන් සභා නිල වෙබ් අඩවිය හරහා පරිශීලනය කල හැකි පරිදි විද්‍යුත් පිටපතක් (**e - Version**)

ලෙසද ප්‍රකාශයට පත් කරන ලදී. එමෙන්ම පර්යේෂණ සංක්ෂිප්ත අතරින් තෝරාගත් පර්යේෂණ පත්‍රිකා 7ක් අදාළ පර්යේෂකයන් විසින් ඉදිරිපත් කරන ලදී. එසේම එහි දී තෝරීපත් වූ පර්යේෂණ පත්‍රිකා අතුරින් රුසියාවෙහි සහ මාලදිවයිනෙහි මැතිවරණ කොමිෂන් සභාවන්හි සමාජිකයන්ගේ පර්යේෂණ පත්‍රිකා, ඔවුන් විසින් මාර්ගගතව ඉදිරිපත් කරන ලද අතර එය 2025 පර්යේෂණ සැසියට ජාත්‍යන්තර සහභාගීත්වය පිළිබිඹු කරන සුවිශේෂී අවස්ථාවක් විය.

පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීමේ අවස්ථාවේ දී මුලසුන (Session Chair) හෙබවූ මහාචාර්ය එම්. ගනේෂමූර්ති මහතා, සිය වසර 30කට අධික විද්වත් අත්දැකීම් උපයෝගී කරගනිමින් එම සැසිය ඉතා සාර්ථකව මෙහෙයවනු ලැබීය. ඉදිරිපත් කළ පර්යේෂණ පත්‍රිකා පිළිබඳව එතුමා දැක්වූ තීක්ෂණ සහ විචාරාත්මක අදහස් සැසියේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමට බෙහෙවින් ඉවහල් විය. ඉතා සුහදශීලී මෙන්ම විනයගරුක අයුරින් කාලය කළමනාකරණය කරමින්, පර්යේෂකයන් දිරිමත් කරමින් එතුමා ඉටුකළ එම විශිෂ්ට මෙහෙය සැමගේ පැසසුමට ලක්විය.

## ඉදිරිපත් කිරීම් පිළිබඳ විස්තර

- **නිතිඥ අමීර් ෆායිස් මහතා, (සාමාජික, මැතිවරණ කොමිෂන් සභාව):** මැතිවරණ අඛණ්ඩතාව තහවුරු කිරීමේ ආයතනයක් ලෙස මැතිවරණ කොමිෂන් සභාවේ ස්වාධීනත්වය ශක්තිමත් කිරීම
- **සෞම්‍ය සන්දීපා සමරසිංහ මෙනවිය (උපාධි අපේක්ෂක)** : ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රීඩාමය කිරීම: ඩිජිටල් විනෝදාස්වාද යුගයේ දේශපාලන සහභාගීත්වය
- **ටිකිරි කුමාර ජයවර්ධන මහතා (සංවර්ධන නිළධාරි, මැතිවරණ කොමිෂන් සභාව):** මැතිවරණවල දී දෘශ්‍යාබාධිත පුද්ගලයින්ගේ ඡන්දය ප්‍රකාශ කිරීමේ රහස්‍යභාවය සහතික කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් හඳුන්වා දුන් ස්පර්ශක ස්ටෙන්සිල් රාමුවේ (Tactile Stencil Frame) භාවිතය පිළිබඳ ගවේෂණාත්මක අධ්‍යයනය. (2024 ජනාධිපතිවරණය, පාර්ලිමේන්තු මැතිවරණය සහ 2025 පළාත් පාලන මැතිවරණ මත පදනම්ව)
- **කේ. තවලිංගම් මහතා (සභාපති, සීමානිර්ණ කොමිෂන් සභාව)** : ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු දේශපාලනය තුළ කාන්තාවන්ගේ භූමිකාව
- **ඉදුනිල් බණ්ඩාර මහතා - (සහකාර මැතිවරණ කොමසාරිස් (පාලන)** : දකුණු ආසියානු පළාත් පාලන ක්ෂේත්‍රයේ කාන්තා කෝටා පද්ධති පිළිබඳ සංසන්දනාත්මක විශ්ලේෂණයක් - ශ්‍රී ලංකාවේ නීති රාමුව ශක්තිමත් කිරීම සඳහා පාඩම්

## අතථ්‍ය ඉදිරිපත් කිරීම

- **පවෙල් වී. ඇන්ඩ්‍රිව් මහතා (කොමසාරිස්, රුසියානු සමූහාණ්ඩුවේ මධ්‍යම මැතිවරණ කොමිෂන් සභාව):** තරුණයින් සමග මැතිවරණ කළමනාකරුවන්ගේ කාර්යය: රුසියානු සමූහාණ්ඩුවේ මැතිවරණ කොමිෂන් සභා පද්ධතියේ අත්දැකීම්
- **ආචාර්ය මොහොමඩ් සහීර් මහතා (මාලදිවයින කොමිෂන් සභාව සාමාජික)** : මැතිවරණ අඛණ්ඩතාව සඳහා ඩිජිටල් මාර්ග, මාලදිවයිනේ නැවත ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ අධ්‍යයනයක්,

තවද එදින ආරාධිත දේශනය පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙහි සහ කොළඹ විශ්වවිද්‍යාලයෙහි නීති පීඨයෙහි පීඨාධිපති ලෙස සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිනිය ලෙස සේවය කරන ලද ආචාර්ය නෙළුම් දීපිකා උඩගම මහත්මිය විසින් සිදු කරන ලදි.

ආචාර්ය නෙළුම් දීපිකා උඩගම මහත්මියගේ දේශනය මඟින් ශ්‍රී ලංකාව 1931 සිට ඉහළ ඡන්ද ප්‍රතිශතයක් පවත්වා ගනිමින් මැතිවරණ ක්‍රියාවලිය තාක්ෂණිකව ජයග්‍රහණය කර තිබුණ ද, සැබෑ ප්‍රජාතන්ත්‍රවාදී අගයයන් සහිත සමාජයක් ගොඩනැගීමට අපොහොසත් වී ඇති බව ප්‍රකාශ විණි.

මැතිවරණ දූෂණය සහ ප්‍රචණ්ඩත්වය අවම වී ඇතත්, පුරවැසියන් තවමත් දේශපාලනඥයන් හුදු "වරප්‍රසාද ලබාදෙන්නන්" ලෙස සලකන වැඩවසම් මානසිකත්වයක (Neo-feudalism) සිරවී සිටින බව ඇය පෙන්වා දෙන ලදී. මෙම තත්ත්වය වෙනස් කිරීම සඳහා ඡන්දය භාවිත කරන ආකාරය ඉගැන්වීමට වඩා, මිනිස් අයිතිවාසිකම් සහ වගවීම පිළිබඳ "පුරවැසි අධ්‍යාපනයක්" පාසල් පද්ධතියට හඳුන්වා දිය යුතු බවත්, නුසුදුසු අපේක්ෂකයන් ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය (NOTA) සහ දේශපාලන පක්ෂ තුළ අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය ඇති කිරීම වැනි රැඩිකල් ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සිදු කළ යුතු බවත් ඇය අවධාරණය කරන ලදී.

ඒ අනුව සමස්ත දේශනය තුළ, බුද්ධි කලම්භනයට සහ මැතිවරණ ක්‍රියාවලිය පිළිබඳ නවෝත්පාදන මාර්ග ගවේෂණය සඳහා වූ වේදිකාවක් ලෙස නිර්මාණය වූ මෙම වැඩ සටහනෙහි තවත් එක් පියවරක් ලෙස විද්වත් කමිටු දෙකක් විසින් මැතිවරණ ක්‍රියාවලියෙහි නව මානයන් සම්බන්ධව පුළුල් සාකච්ඡාවන් පැවැත් වූ අතර ඔවුන් හා සාකච්ඡා කිරීමට, නව අදහස් ලබා දීමට ප්‍රේක්ෂකයන්ට ද අවස්ථාව ලබා දෙන ලදී.

පළමු විද්වත් කමිටු සාකච්ඡාව මෙහෙයවනු ලැබුවේ කොළඹ විශ්වවිද්‍යාලයේ හිටපු උපකුලපතිවරයෙකු සහ දේශබන්දු සම්මානයෙන් පිදුම් ලැබූ සම්මානිත මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක මහතා විසිනි. ප්‍රජා විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර කීර්තියක් දිනූ විශේෂඥයෙකු මෙන්ම වත්මන් මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකයෙකු වන එතුමා, සිය අත්දැකීම් බහුල පෘථුල දැනුම උපයෝගී කරගනිමින් සාකච්ඡාව ඉතා උසස් මට්ටමකින් මෙහෙයවීමට සමත් විය. එතුමාගේ විද්වත් මැදිහත්වීම සම්මන්ත්‍රණයේ ගුණාත්මකභාවය සහ අධිකාරීත්වය තවදුරටත් තහවුරු කරන ලදි.

**එම විද්වත් කමිටු සාකච්ඡාව සඳහා,**

1. **ආචාර්ය රංග කලංසූරිය** රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂ ජනරාල් - සිවිල් සමාජයේ සහ මාධ්‍යයේ භූමිකාව මැයෙන්ද:
2. **ආචාර්ය අජන්තා අතුකෝරල** ,කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතන අධ්‍යක්ෂ - මැතිවරණ තාක්ෂණය සහ නවෝත්පාදනය මැයෙන්ද:
3. **ආචාර්ය පාක්කියසෝති සරවනමුත්තු** නිර්මාතෘ විධායක අධ්‍යක්ෂ - විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මැතිවරණ කෙරෙහි විශ්වාසය සහ පැහැදීම වර්ධනය කිරීම යන මැයෙන්ද :
4. **ආචාර්ය රමේෂ් රාමසාමි** ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - පේරාදෙණිය විශ්වවිද්‍යාලය අන්තර්කරණය සහ ප්‍රවේශ්‍යතාව යන මැයෙන්ද:
5. **ආචාර්ය එන්.එස් ආරියරත්න** ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, රුහුණු විශ්වවිද්‍යාලය ස්ත්‍රී පුරුෂ භාවය සහ දේශපාලනය මැයෙන්ද කරුණු ඉදිරිපත් කරන ලදි.

11 වෙනි පිටුවට




# සතුටු හිතෙන අවුරුද්දක්

**අසිරු කරුණාරත්න**
තොරතුරු තාක්ෂණ සහකාර
මැතිවරණ කොමිෂන් සභාව

සර්වජන ඡන්ද බලය සුරකින ප්‍රජාතාන්ත්‍රික දේශයක් යන්න දැක්ම කරගත් මැතිවරණ කොමිෂන් සභාව තම වගකීම් නිසි පරිදි ඉටු කරමින් මැතිවරණ කොමිෂන් සභාවේ පාර්ශ්ව කරුවන් හට උසස් ගුණාත්මක සේවාවක් ලබා දීමට සමත්වී තිබේ. එසේ සේවාවන් නව්‍යතාවකින් යුතුව නිර්මාණශීලී ලෙස ලබා දීම සඳහා කටයුතු කළ මැතිවරණ කොමිෂන් සභාව ඒ ඔස්සේ 2025 වසර තුළ සුවිශේෂී ජයග්‍රහණ රැසක් ලබා ගැනීමට සමත්ව තිබේ.

2025 වසර ආරම්භයත් සමගම පළාත් පාලන ආයතන ඡන්ද විමසීම පැවැත්වූ අතර, එය නව මැතිවරණ ක්‍රමවේදයක් සහිත අභියෝගාත්මක ඡන්ද විමසීමක් විය. එම අභියෝගයන්ට සාර්ථකව මුහුණ දෙමින් ඡන්ද විමසීම පවත්වා මැතිවරණ කොමිෂන් සභාව මගින්ම සංවර්ධනය කළ ඉ-ප්‍රතිඵල පද්ධතිය භාවිතයෙන් ප්‍රතිඵල සකස් කොට මාධ්‍ය වෙත නිකුත් කරන ලද අතර ඒ මගින් මෙරට ඉතිහාසයේ අවම කාලයකින් ඡන්ද ප්‍රතිඵල නිකුත් කළ ඡන්ද වීමසීම ලෙස වාර්තාවක් තැබීමට ද හැකිවිය. මෙහිදී පළමු ප්‍රතිඵලය ඡන්ද විමසීම අවසන් කර පැය 2 ක් ගත වීමටත් පෙර නිකුත් කළ අතර අඳුර වැටීමට පෙර පළමු ප්‍රතිඵලය දුන් ඡන්ද විමසීම ලෙස ඉතිහාසගත විය.

මැතිවරණ කොමිෂන් සභාව මගින් සිය සේවාලාභීන්ගේ පහසුව සඳහා මැතිවරණ කාර්යාලයට පැමිණීමකින් තොරව සේවා ලබා ගැනීම සඳහා මැතිවරණ ඉ-සේවා හඳුන්වා දී තිබෙන අතර ඒ මගින් 2025 වසරේ දී සේවාලාභීන් ලක්ෂ 80 ක් ඉක්මවා මාර්ගගතව සේවා ලබා දීමට සමත් විය. එය කාර්යාලයට පැමිණීමට නියමිතව සිටි සේවාලාභීන්ට ඔවුන්ගේ අත ළඟටම සේවය ගෙන ගොස් කාලය, ශ්‍රමය, ධනය ඉතිරි කළ ජාතික මෙහෙවරක් ලෙස ඇගයීමට ලක්විය.

2025 වසර විවිධ ආන්තික ජන කණ්ඩායම් වෙත මැතිවරණ කොමිෂන් සභාව වඩාත් සමීප වූ වසරක් ලෙස හඳුනාගත හැකිය. විශේෂයෙන් මෙරට ආදීවාසී ජනතාව වෙත මැතිවරණ ඉ-සේවා හඳුන්වා දෙමින් ඔවුන් ගේ ගැටලු විසඳා දීමට හැකි වූ අතර, ඒ සඳහා දඹාන හා පොල්ලේබැද්ද ආදිවාසී ගම්මාන හා වාකරේ මුහුදු ආදීවාසී ජනතාව වෙනුවෙන් සුවිශේෂි වැඩසටහන් කිහිපයක් සංවිධානය කිරීමට හැකි විය. එමෙන්ම නුවරඑළිය දිස්ත්‍රික්කයේ කඳුකර දෙමළ ජනතාව සහ මෙරට ජන ඝණත්වය අධිකම නගරය ලෙස සැලකෙන කාත්තන්කුඩි ප්‍රදේශයේ ජනතාව වෙත මැතිවරණ ඉ-සේවා ලබාදී ප්‍රතිලාභ ලබා දීමටද මැතිවරණ කොමිෂන් සභාවට 2025 වසරේ දී හැකි විය.

යාපනයේ සිට කිලෝමීටර 42 ක් සහ ප්‍රධාන භූමියෙන් කිලෝමීටර 7 ක් දුරින් පිහිටා ඇති ග්‍රාම නිලධාරී කොට්ඨාස 06 ක, පවුල් 1500 ක, 5000ක පමණ පිරිසක් ජීවත් වන ඩෙල්ෆ් දූපත් වාසීන්ට මැතිවරණ කොමිෂන් සභාවෙන් ලබාගත යුතු සේවාවන් ලබා ගැනීමට බොහෝ දුෂ්කරතා මධ්‍යයේ යාපනය වෙත පැමිණීමට සිදුවූ අතර, එම දුෂ්කරතා සඳහා විසඳුමක් ලෙස මැතිවරණ ඉ-සේවා දූපත් වාසීන්ට හඳුන්වා දෙමින් ප්‍රධාන ගොඩබිමට පැමිණීමකින් තොරව සේවා ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් ලබා දීමට 2025 වසරේදී හැකිවිය.

කිසිවකුත් අත් නොහැරෙන මැතිවරණ ක්‍රියාවලිය තුළ බිහිරි ප්‍රජාවට සුවිශේෂී ස්ථානයක් හිමිවන අතර සංඥා භාෂාවෙන් අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට අවස්ථාවක් නොමැති වීම ඔවුන් මුහුණ දුන් ප්‍රධාන ගැටලුවක් විය. ඒ සඳහා විසඳුමක් ලෙස ඩිජිටල් සංඥා භාෂා උපකාරක සේවයක් හඳුන්වා දීමට 2025 වසරේදී හැකි වූ අතර එය මෙවැනි සේවාවක් මෙරට දී හඳුන්වා දුන් පළමු අවස්ථාව විය.

මැතිවරණයකදී පුරවැසියන්ගේ සක්‍රීය දායකත්වය ඉතා වැදගත් වන අතර රටේ සියලු පුරවැසියන්ට මැතිවරණ නිරීක්ෂකයන් වෙමින් මැතිවරණ පැමිණිලි පහසුවෙන් ඉදිරිපත් කිරීමට 2025 වසරේදී හඳුන්වා දුන් මැතිවරණ පැමිණිලි ජංගම දුරකථන යෙදුම නිසා හැකිවිය. එම ජංගම දුරකථන යෙදුම 2025 **NBQSA** ජාතික තොරතුරු තාක්ෂණ සම්මාන උළෙල රාජ්‍ය අංශයේ රිදී සම්මානයට පාත්‍ර විය.

මැතිවරණ කොමිෂන් සභාව මගින් වාර්ෂිකව ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය සිදුකරනු ලබන අතර ඒ සඳහා ඡන්ද හිමියන් ගණන් ගැනීම ගෙන්ගෙට ගොස් සම්පූර්ණ කරන ආකෘති පත්‍ර මගින් සිදුකරනු ලබයි. මෙම ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම සඳහා මාර්ගගත ක්‍රමවේදයක් හඳුන්වා දුන් අතර 2025 වසරේදී යාපනය දිස්ත්‍රික්කයේ ඡන්ද හිමියන් ගණන් ගැනීම 100% ක්ම මාර්ගගතව සිදු කිරීම ඡන්ද හිමියන් ගණන් ගැනීම ඩිජිටල් කිරීමේ ක්‍රියාවලියේ සාර්ථක සන්ධිස්ථානයකි.

මැතිවරණ ක්‍රියාවලිය සාර්ථක වීමට නම් නිරන්තර දැනුම්වත් කිරීම් ඉතා වැදගත් වේ. මේ සඳහා සුහුරු දැනුම්වත් කිරීමේ ක්‍රමවේද, සුහුරු සාක්කු අත්පත්‍රිකා හඳුන්වා දීම 2025 වසරේදී සිදුකල අතර, පොදු මහජනතාව දැනුවත් කිරීමට අමතරව රාජ්‍ය නිලධාරීන් හට සුහුරු ලෙස මහජනතාවට සේවය ලබා දීම සඳහා විශේෂ පුහුණු කිරීම් ගණනාවක් සිදු කිරීම 2025 වසරේදී සිදුකරන ලදි.

## සමාජ මාධ්‍ය වේදිකා පවත්වාගෙන යාම හා යාවත්කාලීන කිරීම

මැතිවරණ කොමිෂන් සභාවේ නිල සමාජ මාධ්‍ය වේදිකා **(Facebook, You Tube, Tik Tok, Instagram, WhatsApp**) සියල්ල මධ්‍යගත කොට ප්‍රේක්ෂක ආකර්ෂණය ලබා ගත හැකි අයුරින් වඩාත් ආකර්ෂණීය ලෙස පවත්වාගෙන යාම සිදුකර ඇත. නිල සමාජ මාධ්‍ය වේදිකා හරහා පාර්ශ්වකරුවන් දැනුම්වත් කිරීම වෙනුවෙන් කොමිෂන් සභාවේ නිල නිවේදන තොරතුරු හා සංඛ්‍යා සම්පාදනය කිරීම, නිර්මාණය කිරීම, උඩුගත කිරීම ද සිදුකොට ඇති අතර, එමගින් විශාල පරිශීලකයන් පිරිසක් ආවරණය කරන ලදි.

මෙම සමාජ මාධ්‍ය වේදිකා අතරින් You Tube වේදිකාව හරහා සිදු කරන ලද ප්‍රචාරක කාල සීමා පුළුල් වී ඇති අතර, ඒ තුළින් මුදල් ඉපයීමට හැකි වේදිකාවක් (monetization) බවට පරිවර්තනය වී තිබීම අගය කළ යුතු ය.

පූර්වයේදී කොමිෂන් සභා නිල සමාජ මාධ්‍ය වේදිකා පරිශීලනය සීමිත පිරිසකට පමණක් සීමා වී තිබූ අතර, ඉහත වැඩ පිළිවෙල මගින් සමාලෝචිත කාල සීමාව තුළදී එය අඛණ්ඩව පරිශීලනය කරන පිරිස වර්ධනය වී ඇත. එම තොරතුරු මතු දැක්වේ.

| සමාජ මාධ්‍යය | මාධ්‍ය ඒකකය ආරම්භ කිරීමට ප්‍රථම පරිශීලකයන් සංඛ්‍යාව | 2025.12.31 දින වන විට සමස්ත පරිශීලකයන් සංඛ්‍යාව |
|---|---|---|
| You Tube | 900 | 6029 |
| Facebook | 38000 | 77026 |
| WhatsApp | - | 4166 |

මැතිවරණ කොමිෂන් සභාවේ සමාජ මාධ්‍ය වේදිකා පාර්ශ්වකරුවන්/ පරිශීලකයන් අතර ප්‍රචලිත වීම සඳහා හේතු පාදක වූ කරුණු

- මැතිවරණවලට අදාළ තොරතුරු හා දත්ත ඉතා සරලව ඡායාරූප හා ප්‍රස්ථාර සහිතව ඉදිරිපත් කිරීම.
- පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළ ප්‍රතිඵල හා ඡන්දදායක සංඛ්‍යාලේඛන ඉදිරිපත් කිරීම.
- මහජනතාවට සහ මාධ්‍යවේදීන්ට ක්ෂණික නිල තොරතුරු හා නිවේදන ලබා ගැනීමට නිල WhatsApp නාලිකාවක් ආරම්භ කිරීම.
- කොමිෂන් සභාව විසින් සමාජ මාධ්‍ය වේදිකා තුළින් ඉදිරිපත් කරන තොරතුරු, දත්ත, ඡායාරූප ආදිය කොපමණ ග්‍රාහක පිරිසක් පරිශීලනය කළේද යන්න විමසා බැලීම.
- ත්‍රෛභාෂා සන්නිවේදනය - සෑම නිවේදනයක්ම/ තොරතුරක්ම සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම එකවර නිකුත් කිරීමේ හැකියාව තවදුරටත් ශක්තිමත් කිරීම.

මැතිවරණ කොමිෂන් සභාව විසින් දෛනිකව ඉටුකරන රාජකාරී වඩාත් හොඳින් ඉටුකර ගැනීම සඳහා මෙම නවමු ක්‍රියාමාර්ග ඉතා වැදගත් වූ අතර එමගින් සියලු පාර්ශ්වකරුවන් හට ගුණාත්මක සේවයක් ලබා දෙමින් දෙස් විදෙස් කීර්තියක් දිනා ගැනීමට මැතිවරණ කොමිෂන් සභාව සමත් විය. එහි ප්‍රතිඵලයක් ලෙස 2025 වසරේ ලොව හොඳම මැතිවරණ කොමිෂන් සභාව ලෙස සම්මානයට පාත්‍ර වීම මැතිවරණ කොමිෂන් සභාව ලැබූ ඓතිහාසික ජයග්‍රහණයකි. එම ජයග්‍රහණය රටේ සියලුම පුරවැසියන් වෙනුවෙන් හිමිවූ සම්මානයක් වූ අතර ඒ වෙනුවෙන් ඇප කැපවූ මැතිවරණ කොමිෂන් සභාවට 2025 වසර සතුටු හිතෙන වසරක් ලෙස නිමා කිරීමට හැකි විය.




09 වෙනි පිටුවෙන්,

**(වාර්ෂික පර්යේෂණ සැසිය..........ඉතිරි කොටස)**

ඒ අනුව මැතිවරණ ක්‍රියාවලිය සම්බන්ධව සමස්ත ප්‍රජාවගේ ම අවධානය ලබා ගැනීම සඳහා 2025 පර්යේෂණ සැසිය සඳහා එදින සහභාගී වූ විද්වතුන්ට අමතරව, මේ සම්බන්ධව උනන්දු සියලු පාර්ශකරුවන්ගේ පරිශීලනයේ පහසුව පිණිස සමාජ මාධ්‍ය හරහා ද එදින වැඩසටහන ප්‍රසිද්ධ කිරීම සිදු විය.

"මෙහෙයුම් සැලසුම්කරණය සහ අවදානම් කළමනාකරණය තුළින් මැතිවරණ සූදානම ශක්තිමත් කිරීම" යන තේමාව යටතේ මැතිවරණ පද්ධති සඳහා වූ ජාත්‍යන්තර පදනමෙහි වැඩසටහන් නිලධාරී රමෝනා ස්ටීවන් මහත්මියගේ මෙහෙයවීම මත පහත සඳහන් විද්වතුන්ගේ සහභාගීත්වයෙන් දෙවන විද්වත් කමිටු සාකච්ඡාව පැවැත්විණි.

1. **සිල්ජා පාසිලින්නා මහත්මිය -** ජ්‍යෙෂ්ඨ දේශීය අධ්‍යක්ෂ, මැතිවරණ පද්ධති සඳහා වූ ජාත්‍යන්තර පදනම
2. **ලක්ෂිත ජයනායක මහතා -** සහකාර මැතිවරණ කොමසාරිස් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය, පුත්තලම
3. **පුලස්ති පතිරණ මහතා -** සහකාර මැතිවරණ කොමසාරිස් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය, මාතර

මැතිවරණ කාර්යයන් පිළිබඳ උනන්දුව ඇති කිරීම සඳහා මැතිවරණ හා ඡන්ද විමසීම් පරිචයන් පිළිබඳ විද්වතුන් පෙළඹවීමේ අරමුණින්, දත්ත හා තොරතුරු සාක්ෂි පදනම්ව විද්‍යාත්මක ක්‍රමවේද ඔස්සේ සිදු කරන ලද පර්යේෂණ අතුරින් තේරීපත් වූ ප්‍රශස්ත පර්යේෂණ වාර්තා 157හි හිමිකාරත්වය දරන සියලු පර්යේෂකයන් සඳහා වටිනා සහතික පත්‍රයක් ලබා දීම මගින් ඔවුන් ඇගයීමට ලක් කරන ලදී.



**කළමනාකරණ සේවා සේවා නිලධාරීන් සඳහා පැවැත් වූ පුහුණු වැඩමුළුව**




**පෞර කෙටි චිත්‍රපට උලෙළ පිළිබඳව පැවැති දිස්ත්‍රික් දැනුවත් කිරීමේ වැඩමුළුවල විශේෂ අවස්ථා**



**කළුතර ඉංගිරිය ප්‍රදේශයේ වතු ආශ්‍රිත ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩමුළුව**




**වාර්ෂික පර්යේෂණ සැසිය - 2025**


**උපදේශක මණ්ඩලය**
ආර්.එම්.ඒ.එල්. රත්නායක - සභාපති
එම්.ඒ.පී.සී. පෙරේරා - සාමාජික
අමීර් ෆායිස් - සාමාජික
අනුසූයා ෂන්මුගනාදන් - සාමාජික
මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක - සාමාජික
රසික පීරිස් - මැතිවරණ කොමසාරිස් ජනරාල්
එච්.එම්.ටී.ඩී. හේරත් - ලේකම්
බී.පී.සී. කුලරත්න - අතිරේක මැතිවරණ කොමසාරිස්(නීති හා විමර්ශන)

**සංස්කරණය**
චන්න පී. ද සිල්වා
(අධ්‍යක්ෂ, පර්යේෂණ හා ක්‍රමසම්පාදන)
**පරිගණක පිටු සැකසුම**
කේ.වී.පී.ඊ. ලක්තිළිණ (මැතිවරණ කොමිෂන් සභාව)
**මුද්‍රණය**
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
**ප්‍රකාශනය**
පර්යේෂණ හා සැලසුම් ශාඛාව,
මැතිවරණ කොමිෂන් සභාව

**ඔබගේ අදහස් හා යෝජනා අපට ලියන්න**
සංස්කාරක
කතිරයේ බලය
මැතිවරණ කොමිෂන් සභාව,
මැතිවරණ මහලේකම් කාර්යාලය,
02, සරණ මාවත,
රාජගිරිය,
ශ්‍රී ලංකාව.



(+94)112868441-42-43 (+94)112868426 info@elections.gov.lk www.elections.gov.lk elecomsl SriLankaElectionCommission Election Commission of Sri Lanka



මෙම සඟරාවේ ලිපිවල සඳහන් කරුණු පිළිබඳව වගකීම ඒ ඒ ලේඛකයා සතු වන අතර, ලිපිවල ඇතුළත් කරුණුවලින් මැතිවරණ කොමිෂන් සභාවේ අදහස් ප්‍රකාශ නොවේ. මෙහි ඇතුළත් කරුණු, උපුටා පළ කිරීමට අපේක්ෂා කරන්නේ නම් ඒ සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු ය.